කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
Agriculture Modernization Project

THE WORLD BANK

Funded by The European Union

# කෘෂිකර්ම අමාත්‍යාංශය

# කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## (උතුරු පළාත)

ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය ණය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කුඩා ඉඩම් හිමි ගොවීන්ට තරඟකාරී හා අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට, වෙළඳපළ අවශ්‍යතාවයන්, සැපයීමට හා වැඩි වර්ධනය කළ වාණිජකරණය වෙතට ගමන් කිරීමට ඔවුන් සතු හැකියාව වැඩිදියුණු කිරීමට සහාය වීම සඳහා දේශීය සහභාගීත්ව උපායමාර්ගයන්ට සමගාමීව කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි කාල සීමාව මාස 15ක් පමණ වන අතර, ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 90.23 ක් වේ. (ලෝක බැංකු ණය මුදල ඇ. ඩොලර් මිලියන 64.23 සහ යුරෝපා සංගමයේ ප්‍රදානය ඇ. ඩොලර් මිලියන 26.0)

උතුරු පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පහත සඳහන් තනතුර පිරවීම සඳහා පහත දක්වා ඇති සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛනය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. පළාත් මෙහෙයුම් හා ඇගයුම් විශේෂඥ (PS-3)-තනතුරු 01 යි

**අවශ්‍ය සුදුසුකම්**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධියක් **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකමක් **හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තීය සුදුසුකමක් **සමග**

අවම වශයෙන් වසර 10 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ප්‍රථම ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ උපාධියක් **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකමක් **හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තීය සුදුසුකමක් **සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම්

**සමග**

අවම වශයෙන් වසර 08 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

iii. දිවයින ව්‍යාප්ත රාජ්‍ය සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක් දැරීම.

**සමග**

පළමු පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

- අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 64 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය** : 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මත පදනම් වේ.

**සේවා නියුක්තියේ කොන්දේසි** : සියලුම පත්කිරීම් ඉහත කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 ට අනුකූලව සිදු කෙරේ.

**අයදුම්පත්** : තම ජීව දත්ත ඇතුළත් අයදුම්පත, සහතික පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග 2023 ඔක්තෝබර් මස 31 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

- අයදුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය,**
**අංක : 123/2, පන්නිපිටිය පාර,**
**බත්තරමුල්ල.**